**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය -2022**

**--------------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 පෙබරවාරි 13 දිනැති අංක 23/9/22 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය 2023 මාර්තු 01 දින සිට කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨයක් ලෙස ස්ථාපිත කර තිබුණ ද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 06 අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම් පිළියෙළ කරන අවස්ථාව වන විට පීඨයක් බවට පත්වන දිනය පිලිබඳව නිශ්චිත තොරතුරු ලැබී තිබුණේ නැති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව අදාල හෙලිදරව් කිරීම් කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී ලැබිය යුතු පොලිය රු. 426,779 ක් මුදලින් ලැබුණු පොලී ලෙස ආයෝජන ක්‍රියාකාරකම් යටතේද වටිනාකම රු.990,000 ක් වූ භාණ්ඩ පරිත්‍යාග, මුදල් පරිත්‍යාග ලෙසද මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ලැබෙන අතිරික්තය හෝ ඌනතාවය හඳුනා ගැනීම සඳහා සම්පූර්ණ ආයෝජන පොලී ප්‍රමාණය අතිරික්තයෙන් අඩුකර ඇත. එබැවින් එම සම්පූර්ණ මුදලම ආයෝජන ක්‍රියාකාරකම් යටතේ එකතු කර ඇති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 74 හා 75 ඡේද අනුව ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් වලට අදාලව ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතා පාරිභෝජනය කිරීමට අපේක්ෂිත රටාව නිරූපණය වන පරිදි වත්කම් ක්ෂය කිරීමේ ක්‍රමය වාර්ෂිකව සමාලෝචනය කල යුතු වුවද 2021 ජනවාරි 01 දිනට ප්‍රත්‍යාගණනය කර තිබුණු දේපල පිරියත උපකරණ සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී විශ්වවිද්‍යාල වල අනුගමනය කරන ක්‍රමවේදය සොයාබලා ඒ අනුව කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කල යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 47 ඡේදය අනුව දේපල පිරියත උපකරණ සඳහා සෑම වර්ෂ තුනකට හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනයක් සිදුකල යුතු අතර වත්කම් ක්ෂය කිරීමේ ක්‍රමය වාර්ෂිකව සමාලෝචනය කල යුතුය. එහෙත් වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම හේතුවෙන් ධාරණ අගය ශූන්‍ය වූ පිරිවැය රු.28,201,359 ක් වූ පුස්තකාල පොත් තවදුරටත් භාවිතයේ පැවතුණි. | ඉදිරියේදී පුස්තකාල පොත් ප්‍රත්‍යාගණනය සම්බන්ධයෙන් අනෙකුත් විශ්වවිද්‍යාල වල ක්‍රියාත්මක වන ක්‍රමවේදය සොයා බලා ඒ අනුව කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කල යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 14 හි 40 ඡේදය අනුව ආයතනයේ ප්‍රධාන කළමනාකරුවන් පිරිස හා ඔවුන්ගේ සමුච්චිත පාරිශ්‍රමික පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලබන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව අදාල හෙළිදරව් කිරීම් කල යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 හි 118 ඡේදය අනුව රු.1,240,000 ක් වටිනාකමැති අස්පෘශ්‍ය වත්කම් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ වෙනම දැක්වීමකින් තොරව දේපල , පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි. | අස්පෘශ්‍ය වත්කම් වටිනාකම රු.1,240,000ක් පමණක් වේ. මෙම අගය හේතුවෙන් ගිණුම්වලට කිසිදු බලපෑමක් සිදුව නොමැත. ක්ෂය කිරීම් අනුපාතයන්හිද වෙනසක් නොමැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව අදාල හෙළිදරව් කිරීම් කල යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 772 හා 2022 සැප්තැම්බර් 09 දිනැති අංක 10/2022 දරන වත්කම් | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණවලින් හඳුනාගත් විෂමතා හා අපහරණ කටයුතු කඩිනමින් සිදුකල | 2023.03.01 වන දින සිට දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, දේශීය වෛද්‍ය පීඨය බවට පත්වීම නිසා | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ මෙම ප්‍රකාරව |

| | | | | |
|---|---|---|---|---|
| | කළමනාකරණ චක්‍රලේඛය | යුතු වුවද 2021 හා 2022 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | ආයතනයේ වත්කම් කොළඹ විශ්වවිද්‍යාලය වෙත භාරදීමේ කටයුතු දැනට සිදු වෙමින් පවතින අතර අදාළ අනුමැතින් මත ජුලි 15 දිනට පෙර එම අපහරණ කටයුතු සිදු කිරීම සඳහා දැනට සැලසුම් කර ඇති බව. | කටයුතු කල යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 371 හා 2015 ජුලි 14 දිනැති අංක 03/ 2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | තත්ත්කාර්ය අතුරු අග්‍රිම එක් අවස්ථාවකදී රු. 100,000 උපරිමයක් දක්වා පමණක් නිකුත් කල හැකි වුවත් ඊට පටහැනි ලෙස අවස්ථා 6 කදී රු.114,000 බැගින් අතුරු අග්‍රිම ලබාදී තිබුණි. | කළමනාකරණ මණ්ඩල සාමාජික මහත්ම මහත්මියන්ගේ දීමනාව ගෙවීම සඳහා මෙම මුදල් ලබාගෙන ඇත. විගණන කමිටුව සමග සාකච්ඡ කිරීමෙන් අනතුරුව සෘජුවම බැංකුව වෙත ගෙවීමට කටයුතු කර ඇති බව. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | චක්‍රලේඛ | | | |
| i | 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/ 214/19/2023 දරන දරන භාණ්ඩාගාර ලේකම් විසින් අධ්‍යාපන ලේකම් ඇමතූ චක්‍රලේඛ ලිපිය | බැඳුම්කර උල්ලංඝනය කිරීම් මත අයකර ගන්නා මුදල් ලද සැනින් භාණ්ඩාගාරය වෙත යැවිය යුතු වුවද රු. 4,230,939 ක් මුදල් කමිටුවේ අනුමැතිය මත ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 737 අනුව කටයුතු කර ඇති බව. | යොමුගත චක්‍රලේඛ ලිපිය අනුව කටයුතු කළ යුතුය |
| ii | 1971 අංක 38 දරන මුදල් පනතේ II වන වගන්තිය සහ 2019 ජුලි 29 දිනැති අංක 04/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපිය | අදාල අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව මුදල් කමිටු අනුමැතිය මත 2022 දෙසැම්බර් 31 දිනට රු.32,950,223 ක් ආයෝජනය කර තිබුණි. | අතිරික්ත මුදල් ආයෝජන ගිණුමේ රු.32,950,223.00 ලෙස වාසිදායක ශේෂයක් ලෙස දක්වා ඇත්තේ බැංකු ගිණුම් හතරෙන්ම ආයෝජනය වූ මුදල් බව. | යොමුගත රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| iii | 2018 මාර්තු 19 දිනැති අංක 01/ 2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | 2021 වර්ෂයේදී වාහන විකිණීමෙන් ලැබී තිබුණු රු.1,327,500 ක් භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර නොමැත. | යොමුගත රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

## 1.7 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය සතු ඉඩමකින් පර්චස් 10.08 ක කොටසක් 2014 වර්ෂයේ පෞද්ගලික ආයතනයකට විකුණා ලබාගත් මුදල්, 2013 ජූනි 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දේශීය වෛද්‍ය ආයතනයට මාරු කිරීමට පමණක් අනුමත කර තිබුණි. ඒ අනුව මාසික මුදල් අවශ්‍යතාවය සඳහා එම මුදල් යොදවා ගත යුතුව තිබියදී ආයතනයේ මුදල් කමිටුවේ අනුමැතිය මත ස්ථාවර තැන්පතු දෙකක ආයෝජනය කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට එම ආයෝජන ගිණුමේ ශේෂය රු. 16,407,211 ක් ව පැවතුණි. | ආයතනය සතු ඉඩමෙන් කොටසක් විකුණා ඇත්තේ අමාත්‍ය මණ්ඩල තීරණයක් පරිදි වන අතර එම මුදල් ප්‍රමාණය මහා භාණ්ඩාගාරයට යැවීමට නොව ආයතනයේ සංවර්ධන කටයුතු සඳහා යෙදවීමට අනුමැතිය ලබා දී ඇති බව. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දේශීය වෛද්‍ය ආයතනයට මාරු කිරීමට පමණක් අනුමත කර තිබුණු බැවින් මාසික මුදල් අවශ්‍යතාවය සඳහා එම මුදල් යොදවා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.10,565,628 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.2,097,926 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.12,663,554 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට, රාජ්‍ය ප්‍රධාන ලැබීම් වැඩිවීම හා ආයෝජනය සඳහා පොළී ලැබීම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

විගණනය සඳහා ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශන අනුව ඉකුත් වර්ෂයේ 4.1 ක්ව පැවති ජංගම අනුපාතය සමාලෝචිත වර්ෂයේදී 2.9 දක්වා අඩු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 24 ක කාලයක සිට ශිෂ්‍ය නේවාසිකාගාරයක් පවත්වාගෙන යනු ලබන වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි සහිත ඉඩම 2023 මැයි මාසය දක්වා දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම පවරා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතින බව. | පවරා ගැනීමේ කටයුතු කඩිනමින් සිදුකල යුතුය. |
| (ආ) | සිසුන්ට ලබාදීම සඳහා 2021 වර්ෂයේ දී රු.5,602,500 ක් වැය කර මිලදී ගෙන තිබුණු Tab පරිගණක 90හි සිසුන් සමඟ ඇතිකරගත් ගිවිසුම් 2023 ජූනි 27 දින වන විට කල් ඉකුත් වී තිබුණි. එහෙත් ගිවිසුම් ප්‍රකාරව පරිගණක ආපසු ලබා ගැනීමට හෝ නැවත ගිවිසුම් අලුත් කිරීමට හෝ 2023 අගෝස්තු 10 දින වන විටත් ආයතනය විසින් කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව වර්ෂයක කාලයකට ලබා දී තිබුණද, අතපසුවීමකින් නැවත අලුත් කිරීමට නොහැකි වී තිබුණු බව. | ගිවිසුම් අලුත් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 අගෝස්තු 01 දිනැති අංක 17/1578/716/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පිරිමැසුම් දායක තාක්ෂණය (NERD Technology) උපයෝගි කර ගනිමින් රු. මිලියන 50 ක උපරිම සීමාවකට යටත්ව උපදේශනය, සැලසුම් කිරීම හා ඉදිකිරීම ශ්‍රී ලංකා ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERDC) වෙත රු.47,588,255 (බදු රහිත) ඇස්තමේන්තු වටිනාකමක් යටතේ මහල් තුනකින් යුත් ගොඩනැගිල්ල දින 321 කින් නිම කිරීමට 2022 දී පවරා තිබුණි. 2023 අගෝස්තු 10 දින වන විට දින 522 ක් ගතකර තිබුණු අතර රු.58,868,965 ක් ගෙවීමට නියමිතව තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුමේ 04 ඡේදය පටහැනිව අනුමැතියකින් තොරව NERD ආයතනය විසින් මේ සඳහා උප කොන්ත්‍රාත්කරුවෙකු පත් කරගෙන තිබුණි. | රටේ පැවති අස්ථාවර තත්ත්වය හේතුවෙන් වැඩි කාලයක් ගත වුවද දින 150 ක කාලය දීර්ඝකිරීමක් අනුමත කර ඇති අතර ප්‍රමාද ගාස්තු අයකිරීමට ද කටයුතු යොදා ඇත.<br>මෙය සේවාදායකයා වෙත නීත්‍යානුකූලව නොදන්වා සිදු කර ඇති අතර ආයතනය පර්යේෂණ ආයතනයක් බැවින් ඔවුන්ට කොන්ත්‍රාත් සිදුකිරීමට සේවකයින් නොමැති බව. | පිරිවැය අවමවන පරිදි ඉදිකිරීම කඩිනම් කර ගොඩනැගිල්ල උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ යටතේ සැලසුම් කර තිබුණු ක්‍රියාකාරකම් 79 කින් 44 කම භෞතික සහ මූල්‍ය ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු අගයන් ගෙන තිබුණි. | රටෙහි පැවති උද්ධමනකාරී තත්ත්වය හා වසංගත රෝග තත්ත්වයන් හේතුවෙන් ක්ෂේත්‍ර චාරිකා වැඩමුළු හා වෛද්‍ය සායන, සිදුකිරීම සීමාවීම, ප්‍රතිපාදන නොලැබීම හා කප්පාදු කිරීම හේතුවෙන් ප්‍රගතිය අඩු මට්ටමක පැවතුණු බව. | සැලසුම් කල පරිදි ප්‍රගතිය ළගා කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2020, 2021සහ 2022 වර්ෂවල දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ආයුර්වේදය හා යුනානි උපාධි හදාරන සිසුන් ආයතනය හැරයාමේ ප්‍රතිශතය සියයට 12 සිට සියයට 27 ක් දක්වා වර්ධනය වී තිබුණි. | දේශීය වෛද්‍ය පීඨයේ ආයුර්වේද හා යුනානි උපාධි හදාරන සිසුන් වෙනත් උපාධි පාඨමාලා වෙත යොමුවීම, පෞද්ගලික හේතූන් මත උපාධි පාඨමාලාව අවලංගු කර ගැනීම, විභාග අසමත්වීම වැනි කරුණු හේතුවෙන් හැරයාමේ ප්‍රතිශතය වැඩිවී තිබුණු බව. | සිසුන් ආයතනය හැරයාමේ ප්‍රතිශතය අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |